**ලංකාපුර ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජුලි 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට **ලංකාපුර** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

(අ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉටුකළ පළාත් පාලන මාර්ග ව්‍යාපෘති 09 ක් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබිය යුතු හා සභාව විසින් ගෙවිය යුතු රු. 2,872,999 ක මුදල කර්මාන්ත ණයගැතියන් හා කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පිළිසරු ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන කුඩා පරිමාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබිය යුතු රු. 4,398,046 ක මුදල ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) තඹාල ගවඝාතකාගාරය පිහිටි ඉඩමට ප්‍රවේශ මාර්ගයක් තැනීම සඳහා අත්පත් කරගත් ඉඩම් කොටස් සඳහා රු. 80,000 ක් වැයකර ඇතත්, එම ඉඩම් කොටසේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය අනුව ගොඩනැගිලි වටිනාකම රු. 8,603,775 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු .45,937,435 ක් වූයෙන් රු. 37,333,660 ක නොසැසඳීමක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ මෝටර් රථ හා කරත්තවල වටිනාකම් සටහන් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 51,044,033 ක් වූයෙන් රු. 51,044,033 ක නොසැසඳීමක් විය.

1.3.3 ලැබියයුතු ගිණුම්

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබෙන ලැබියයුතු ගිණුම් ශේෂ වටිනාකම රු. 7,989,472 ක් වූ අතර, එයින් වර්ෂ 3 – 5 අතර රු. 1,068,000 ක් සහ වර්ෂ 5 ට වැඩි රු. 692,461 ක් වූ ශේෂයක් ඇතුලත්ව තිබුණු අතර එම ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවිය හැකි අවස්ථා වලට අනුකූල නොවී, සභාපතිවරයාට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන, දුරකථන, ලිපිද්‍රව්‍ය දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 265,750 ක මුදලක් සභා අරමුදලෙන් ගෙවා තිබුණි.

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,960, 090 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,382,089 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1. හිඟ කඩකුලී

-------------

2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ලැබීයයුතු රු. 1,448,226 ක් වූ මස්කඩ කුලී ආදායම් මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

03 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ) සභාවේ කාර්යයන්හි නියුක්ත නිලධාරින් හා සේවකයින් සංඛ්‍යාව 58 ක් වුවද එම නිලධාරින්ගෙන් 10 දෙනෙකුට පමණක් රාජකාරි පැවරීම් ලිඛිතව ලබාදී තිබුණි.

(ආ) සභාව සතු සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයේ මාසික ආදායම් හා වියදම් පිළිබඳ විස්තර සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභා බල ප්‍රදේශයේ දිනකට ජනනය වන කසල ටොන් 4 .5 න් දිනකට ටොන් 3 ක් පමණ සභාවේ කම්කරුවන් හා ට්‍රැක්ටර් භාවිතා කර තල්පොත පිහිටි සභාව සතු අක්කර 05 ක පමණ භූමියට බැහැර කරනු ලබයි. මෙම කසල සම්බන්ධයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියකට 2016 අප්‍රේල් මාසය වන විටද සභාව අවධානය යොමුකර නොතිබෙන තත්ත්වය තුල විවෘතව තිබෙන කසල හේතුවෙන් පාරිසරික සහ සෞඛ්‍ය ගැටළු උද්ගතවී තිබුණි.

4. යහපාලනය සහ ගිණුම්කටයුතුභාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව අයවැයගත ආදායම් වියදම් හා තථ්‍ය ආදායම් වියදම් අතර වෙනස්කම් නිරීක්ෂණය විය. වියදම් විෂයයන් සියයට 18 සිට සියයට 100 දක්වා ප්‍රතිශතයකින්ද, ආදායම් විෂයයන් සියයට 06 සිට සියයට 94 දක්වා ප්‍රතිශතයකින්ද විචලනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ අයවැය ලේඛන අනුව සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ තුල පිහිටි දේපලවලින් වරිපනම් බද්දක් අයකිරීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු සභාවට පත්කර ගෙන නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරිම

------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

----------------------------

මූලාා ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි යටතේ දක්වා තිබෙන ඉඩම් කැබලි 22 ක් සඳහා සභාව නමින් ඉඩම් ඔප්පු හෝ හිමිකම් සහතික පත්‍ර ලබාගෙන අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ඝණ අපද්‍රව්‍ය කළමණනාකරණය